# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2023 අංක 33 දරන මුදල් පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 දෙසැම්බර් මස 13 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 දෙසැම්බර් මස 15 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 18.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2023 අංක 33 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2023 දෙසැම්බර් මස 13 වන දින]

එල්.ඩී.-ඕ. 76/2021

**2018 අංක 35 දරන මුදල් පනත සහ 2012 අංක 12 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා ද; 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත අදාළ වීමෙන් ඇතැම් තැනැත්තන් නිදහස් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2023 අංක 33 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

1 වන කොටස

**2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම**

**2.** (මේ කොටසේ මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2018 අංක 35 දරන මුදල් පනතේ 48 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2018 අංක 35 දරන මුදල් පනතේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම

"(2අ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට බලපවත්වන පරිදි ස්ථාවර දුරකථන මාර්ගයෙන් විශාල සංඛ්‍යාවකින් යවනු ලබන ප්‍රචාරක දැන්වීම් මත එක් එක් ජංගම දුරකථන කෙටි පණිවුඩයකට ශත 25 ක අය බද්දක් අය කරනු ලැබිය යුතු ය.

(2ආ) අය බද්ද අය කරනු ලබන ජංගම දුරකථන කෙටි පණිවුඩය ප්‍රචාරය කිරීමට අදහස් කරනු ලබන දැන්වීම්කරු විසින් (2අ) උපවගන්තිය යටතේ පනවන ලද අය බද්ද ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ජංගම දුරකථන කෙටි පණිවුඩය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :-

" "ජංගම දුරකථන කෙටි පණිවුඩය" යන්නෙන් ජංගම දුරකථන හෝ ස්ථාවර දුරකථන හරහා යවනු ලබන වචන ඇතුළත් පණිවුඩයක් අදහස් වේ;";

(2) "විශාල සංඛ්‍යාවකින් යවනු ලබන ප්‍රචාරක දැන්වීම්" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :-

" "විශාල සංඛ්‍යාවකින් යවනු ලබන ප්‍රචාරක දැන්වීම්" යන්නෙන් වාණිජ පරමාර්ථ සඳහා ලැබුම්කරුවන් සමූහයක් වෙත ජංගම දුරකථන හෝ ස්ථාවර දුරකථන හරහා යවනු ලබන වචන ඇතුළත් පණිවුඩ අදහස් වේ.".

## II වන කොටස

## 2012 අංක 12 දරන මුදල් පනත සංශෝධනය කිරීම

2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටස සංශෝධනය කිරීම

**4.** 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ උපලේඛනයේ 6 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"7. 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත.".

## III වන කොටස

### 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත අදාළ වීමෙන් ඇතැම් තැනැත්තන් නිදහස් කිරීම

1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත අදාළ වීමෙන් ඇතැම් තැනැත්තන් නිදහස් කිරීම

**5.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද -

(අ) 2020 මැයි මස 22 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත යටතේ සාදන ලද 2020 මැයි මස 22 වන දින අංක 2176/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2020 අංක 2 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් පනවනු ලැබ ඇති තහනම් කිරීම් සහ සීමා කිරීම් හේතුවෙන් 2021 නොවැම්බර් මස 12 වන දින හෝ ඊට පෙරාතුව ශ්‍රී ලංකා රේගුවෙන් ඉවත් කර නොගත් යම් මෝටර් වාහනයක්; හෝ

(ආ) 2021 නොවැම්බර් මස 12 වන දින හෝ ඊට පෙරාතුව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහ මෙහි උපලේඛනයේ සඳහන් යම් පනතක් ප්‍රකාරව ගෙවීමට යටත් යම් බද්දක් නොගෙවීම හේතුවෙන් මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකා රේගුවෙන් ඉවත් කර නොගත් විදුලියෙන් ධාවනය වන යම් මෝටර් වාහනයක්,

ආනයනය කරනු ලබන තැනැත්තකුට, 6 වන වගන්තියේ විධිවිධාන යටතේ අධිභාරයක් ද සමඟ නියමිත බදු මුදල් ප්‍රමාණය ගෙවීමට යටත්ව ඒ මෝටර් වාහනය ශ්‍රී ලංකා රේගුවෙන් ඉවත් කර ගැනීම සඳහා අවසර ලබා දිය යුතු ය.

බද්ද එකතු කිරීම

**6.** (1) (අ) 5 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් මෝටර් වාහනයක්, ආනයනය කරන ලද යම් තැනැත්තකු, ණයවර ලිපිය විවෘත කරනු ලබන දිනයේ දී නියමිත මුළු බදු මුදල් ප්‍රමාණයට 10%ක අධිභාරයක් ද සමඟ ශ්‍රී ලංකා රේගුවෙන් එම මෝටර් වාහනය ඉවත් කරනු ලබන දිනයේ දී මෙහි උපලේඛනයේ සඳහන් යම් පනතක විධිවිධාන ප්‍රකාරව නියමිත බදු ප්‍රමාණය මෙම පනත ක්‍රියාත්මක වන දින සිට දින හැටක් ඇතුළත ගෙවීමට යටත් විය යුතු ය; සහ

(ආ) 5 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් විදුලියෙන් ධාවනය වන යම් මෝටර් වාහනයක්, ආනයනය කරන ලද යම් තැනැත්තකු, ණයවර ලිපිය විවෘත කරනු ලබන දිනයේ දී නියමිත මුළු බදු මුදල් ප්‍රමාණයට 10% ක අධිභාරයක් ද සමඟ, ණයවර ලිපිය විවෘත කරනු ලබන දිනයේ දී මෙහි උපලේඛනයේ සඳහන් යම් පනතක විධිවිධාන ප්‍රකාරව නියමිත බදු ප්‍රමාණය මෙම පනත ක්‍රියාත්මක වන දින සිට දින හැටක් ඇතුළත ගෙවීමට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ගෙවීම් ලැබීමෙන් පසුව රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ මෝටර් වාහනය ශ්‍රී ලංකා රේගුවෙන් ඉවත් කර ගැනීමට අවසරය ලබා දෙනු ලැබිය යුතු ය.

(3) යම් රේගු බද්දක් එකතු කිරීම සහ අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ වන්නා වූ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන, මේ කොටස යටතේ වන බද්ද එකතු කිරීම සහ අය කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය

**7.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ කොටසේ -

"රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;

"විදුලියෙන් ධාවනය කරනු ලබන වාහනය" යන්නෙන් පැදවීම සඳහා විද්‍යුත් මෝටරයක් පමණක් සහිත යම් මෝටර් වාහනයක් අදහස් වේ;

"මෝටර් වාහනය" යන්නෙන් -

(අ) මාර්ගවල භාවිත කිරීම සඳහා අදහස් කරන ලද හෝ අන්වර්තිත ට්‍රැක්ටරයක් හෝ ට්‍රේලරයක් ඇතුළු යන්ත්‍රානුසාරයෙන් හෝ විදුලියෙන් හෝ සූර්ය බලයෙන් හෝ ධාවනය කරනු ලබන හෝ ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් හෝ විකල්ප ඉන්ධනවලින් ධාවනය කරනු ලබන වාහනයක් අදහස් කරන නමුත් ඊට ගල් රෝලක් ඇතුළත් නොවේ;

(ආ) මට්ටම් කිරීම, මඩ කැණීම, පස් ඉවත් කිරීම, කැළෑ වැවීම හෝ එවැනි යම් සමාන කටයුත්තක් වැනි කෘෂිකාර්මික හෝ ඉදිකිරීමේ කාර්යයක් සම්බන්ධයෙන් ගොඩබිම භාවිත කිරීම සඳහා අදහස් කරන ලද යන්ත්‍රානුසාරයෙන් හෝ විදුලියෙන් හෝ සූර්ය බලයෙන් ධාවනය කරනු ලබන හෝ ද්‍රව පෙට්‍රෝලියම් වායුවෙන් හෝ විකල්ප ඉන්ධනවලින් ධාවනය කරනු ලබන වාහනයක් අදහස් කරන නමුත් ඊට ගල් රෝලක් ඇතුළත් නොවේ; සහ

"බද්ද" යන්නට මෝටර් වාහනයක් ආනයනය කිරීමට අදාළව උපලේඛනයෙහි සඳහන් පනත් යටතේ ගෙවිය යුතු හෝ අය කරනු ලබන යම් බද්දක්, දණ්ඩනයක්, අධිභාරයක්, අය බද්දක්, තීරු බද්දක්, අය කිරීමක් හෝ දායක මුදලක් ඇතුළත් වේ.

8. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**උපලේඛනය**

(5 වන සහ 6 වන වගන්ති)

1. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත;
2. 2018 අංක 35 දරන මුදල් පනත;
3. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත;
4. 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත;
5. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.